www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉතිහාසය සහ විප්ලවවාදී පක්ෂය

## History and the revolutionary party

**ඔක්තෝබර් 31, 2008**

සමාජවාදී සමානතා පක්ෂයේ ආරම්භක සම්මේලනය අගෝස්තු 3-9 දිනවල දී මිචිගන්හි ඈන් ආබර් නගරයේ දී පවත්වනු ලැබුනි. මෙම සම්මේලනයේ දී සම්මත කරගනු ලැබුනු, *සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම්* යන අතිශය වැදගත් ලියවිල්ල දැන් පොතක් වශයෙන් එළි දැක්වී ඇති අතර එය www.wsws.org වෙබ් අඩවියෙන් ඇනවුම් කල හැක.

විශේෂයෙන් ම, සසප සම්මේලනය පැවැත්වීමෙන් පසු පුපුරා ගිය ගෝලීය ආර්ථික අර්බුදයේ තතු යටතේ, *සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම්* ලියවිල්ල මුද්‍රන ද්වාරයෙන් පිටවුනු අවස්ථාවේ, එහි අර්ථභාරය සලකා බැලීම උචිත ය.

විප්ලවවාදී සමාජවාදී පක්ෂයක් ගොඩනැගීම එම යුගයේ ස්වභාවය පිලිබඳ ඓතිහාසික තක්සේරුවක්, ධනවාදයේ අර්බුදය පිලිබඳ විශ්ලේෂනයක් හා ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සහ කම්කරු පන්තියේ අතිමූලික අත්දැකීම්වල පාඩම් මත පදනම් කල යුතු බව ලියවිල්ල අවධාරනය කරයි.

එය දක්වා සිටින පරිදි:

"විප්ලවවාදී සමාජවාදී මූලෝපාය වර්ධනය කල හැකි වන්නේ අතීත අරගලවල පාඩම් මත පමනි. අන් සියල්ලට මත් වඩා සමාජවාදීන් අධ්‍යාපනගත කර ගැනීමේ ලා, හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ සවිස්තර ඥානයක් අත්‍යවශ්‍ය වේ. සමාජවාදී විප්ලවයේ න්‍යායික හා දේශපාලන හී තුඩ වූ මාක්ස්වාදය එහි වඩාත්ම තියුනු මුවහත අත් කර ගෙන ඇත්තේ 1938 දී ආරම්භ කරනු ලැබූ හතර වන ජාත්‍යන්තරය, එතැන් පටන් ස්ටැලින්වාදයට, ප්‍රතිසංස්කරනවාදයට, පැබ්ලෝවාදයට සහ වෙනත් සකල වර්ගවල දේශපාලන අවස්ථාවාදයන්ට එරෙහිව නිමග්න වූ අරගලයන් තුලිනි.

"ක්‍රියාමාර්ගය හා කර්තව්‍යයන් පිලිබඳ අවශ්‍ය කාරනා මත පක්ෂය තුල දේශපාලන එකඟත්වය, 20 වන සියවසේ ඓතිහාසික අත්දැකීම් හා ඒවායේ කේන්ද්‍රීය මූලෝපායාත්මක පාඩම් පිලිබඳ පොදු ඇගැයුමක පදනම මත හැරෙන්නට අත් කර ගත නොහැකි ය. . . . කම්කරු පන්තිය, ජයග්‍රහනයන්හි පාඩම් පමනක් නොව පරාජයන්හි පාඩම් ද ඇතුලුව ඉතිහාසයේ පාඩම් උගන්නා තරමට පමනක්, එම පන්තියට විප්ලවවාදී අරගලයේ නව කාල පරිච්ඡේදයක් විසින් ඉදිරිපත් කරනු ලබන්නා වූ නව අභියෝගයන් සඳහා සූදානම් විය හැකිය."

මෙම ඓතිහාසික හා න්‍යායික මූලධර්මවල අතිමූලික සංකල්පනය, සසප සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, අනෙකුත් වමේ සියලුම සුලු ධනපති සහ අවස්ථාවාදී දේශපාලන ධාරාවන්ගෙන් බෙදා වෙන්කරයි.

උදාහරනයක් ලෙස, ප්‍රංසයේ පැබ්ලෝවාදී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (Ligue Communiste Revolutionnaire) දේශපාලනිකව අරූපික "ධනපති විරෝධී පක්ෂයක්" ගොඩනැගීමට පෙරට එයි. මෙම අවස්ථාවාදී ප්‍රයත්නය, එහි ස්වභාවයෙන් ම, කිසිදු පැහැදිලි වැඩපිලිවෙලක් සමග හෝ දේශපාලන මූලධර්ම කෙරෙහි වූ බැඳීරුම් ආකල්පයක් සමග අනුරූප නො වේ. මාක්ස්වාදයේ න්‍යායික පදනම්වලට හා හතරවන ජාත්‍යන්තරයේ ඓතිහාසික අත්දැකීම්වලට ඇති තම පිලිකුල LCR සංවිධානය එහි ගුනය ලෙස සලකයි. LCR සංවිධානයේ ප්‍රධාන මහජන මාධ්‍ය ප්‍රකාශක ඔලිවර් බිසැන්සෙනොට් නිශ්චිත ලෙස ප්‍රකාශ කලේ ඉතිහාසයේ පාඩම් පිලිබඳ පරීක්ෂා කර බැලීමක්, ඔවුන්ගේ "ධනපති විරෝධී" පක්ෂය ගොඩනැගීමට බාධාවක් වීමට ඉඩ නොදිය යුතු බවයි.

"විවිධ දෘශ්ඨිවාදාත්මක හා ඓතිහාසික "උරුමයන්" ගැන සාකච්ඡාව සිත්ගන්නාසුලු විය හැක. එලෙස ම එය නිසැක වශයෙන්ම කල් ඇදෙන එකක් වනු ඇත. නමුත් අපට එලෙස පටන් ගත නො හැක" පසුව ඔහු ප්‍රකාශ කලේ LCR සංවිධානය එහි අනාගත සහකරුවන් වන අයට ඔවුන්ගේ අතීතය සලකා, එය "ට්‍රොට්ස්කිවාදයේ සමාන්‍ය ඉතිහාසය හෝ LCR සංවිධානයේ යම් කාලයක්" හෝ වේවා, "බලපෑම්" කිරීමට උත්සුක නොවන බව යි.

මේ ආකාරයට ම ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායමේ ඩේවිඩ් පැකාර්ඩ් ප්‍රකාශ කලේ තම සංවිධානයට "අපේම ඉතිහාසගත වචනමාලාව මෙම සාකච්ඡාව මත (නව

වාම පක්ෂයක් ගැන) බලපෑමක් යෙදීම අනවශ්‍යය" යන්නයි.

*සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම්* සනිටුහන් කරන්නේ සසප මෙවැනි අවස්ථාවාදී සංකපයන් සමග යුදවැදී සිටින බව යි. අප සක්සුදක් සේ පැහදිලි කරන කරුන නම් හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමට හා ගොඩනැංවීමට පදනම් සැපයූවා වූ ඓතිහාසික සංකල්පයන් මත මුල් බැස ගත් අප ව්‍යාපාරය එය සමග වෙන් කල නොහැකි සේ බැඳී සිටින බවයි.

1930 ගනන්වලින් පසු ලෝක ධනවාදය මුහුන දුන් දැවැන්තම අර්බුදයේ පුපුරා ඒම මගින් මෙම සංකල්පයන්ගේ වැදගත්කම කදිමට පසක් කර දෙයි. එම කාලයේ දේශපාලන පාඩම් හා ඒවායේ ඛේදනීය ප්‍රතිඵලයන් ඇතුලත් කර ගත්තා වූ කෘතියක් මුද්‍රණ ද්වාරයෙන් පිටවීම කෙතරම් කාලෝචිත දෑ

හතර වන ජාත්‍යන්තරයේ උරුමය, අපගේ පක්ෂයේ දැවැන්තම බලය හා විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැංවීමේ ශක්තිමත් පදනම ද ලෙස අපි දකිමු.

ලියැවිල්ල ප්‍රකාශ කරන පරිදි:

"සමාජවාදී සමානතා පක්ෂය හා ජාත්‍යන්තර කමිටුව විශාල ඓතිහාසික සම්ප්‍රදායක් නියෝජනය කරමින් එය පෙරට ගෙනයයි. තමන්ගේ ම ඉතිහාසය යලි පාදාගැනීමට අවශ්‍ය වුවත් එසේ කල හැකි, වෙනත් කිසිදු දේශපාලන ව්‍යාපාරයක්, ඇත්තේ නැත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, ස්ටැලින්වාදීන්, වෘත්තීය සමිති හා පැබ්ලෝවාදී ප්‍රවනතාවන් වැනි අවස්ථාවාදී සංවිධානවලට තකතිරුකම් හා අපරාධවල සිය අතීත වාර්තාව සිහිපත් කිරීමේ අශාවක් නැත. ඉතිහාසයට හා මූලධර්මවලට අයාචනය කිරීමෙන් ඔවුන්ගේ අවස්ථාවාදී උපාමාරු පිලිබඳ අභ්‍යාසය තුල සිරවීමට ද ඔවුන් අකැමති ය. සිය දේශපාලන කටයුතු ශ්‍රේෂ්ඨ මූලධර්ම මත දැනුවත්ව පදනම් කල හැකි එකම පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනි. එබැවින් කිසිදු හිඩැසකින් තොරව සිය ඉතිහාසය කම්කරු පන්තිය වෙත පිලිගැන්විය හැක්කේ ද එයට ම පමනි. එය සිය ධජය වෙතට කම්කරුවන් හා තරුනයන් අතර අතිශයෙන්ම අධිෂ්ඨානශීලී, ධෛර්‍යය සම්පන්න හා අවංක කොටස් ආකර්ෂනය කර ගනු ඇත."

*සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම්* ඇමරිකානු හා ලෝක ධනවාදයේ අර්බුදය මගින් අරගලයට තල්ලු කෙරෙන නව පරම්පරාවක කම්කරුවන් සහ තරුනයන් විසින් කියවිය යුතු, අධ්‍යයනය කල යුතු හා විවාදයට භාජන කල යුතු කෘතියකි.

**බැරි ග්‍රේ**

© www.wsws.org